# කොළඹ නගර සංවර්ධනයට මිලින්දගෙන් 'පුරසවිය'



(රන්ජිත් ආනන්ද ජයසිංහ)

කොළඹ නගරයේ සංවර්ධනය සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධාන පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා පුරසවිය" වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව සන්ධානය වෙනුවෙන් නිකුත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි දැක්වේ.

සන්ධානය යෝජනාකර තිබෙන පුරසවිය වැඩසටහනට සමගාමීව හෙට ***13 වැනි පිටුවට..***

## කොළඹ නගර...

***... 1 වැනි පිටුවෙන්***

සිට පිබිදෙන කොළොම්පුර" නමින් නාගරික සංවර්ධන ව්‍යාපෘතියක්ද දියත් කෙරෙන බව නගර සභා ආරංචි මාර්ග සඳහන් කරයි. මේ සඳහා රුපියල් මිලියන 180 ක් වැය කෙරෙයි. බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ මෙහෙයැවීමෙන් මෙම වැඩසටහන දියත් කෙරෙයි.

මාර්ග සංවර්ධනය, ජලය හා විදුලිය සැපයුම සහ නගර අලංකරණය සඳහා ආරක්ෂක ලේකම්වරයා දියත්කර තිබෙන වැඩසටහනට දායකවීම පිබිදෙන කොළොම්පුර වැඩසටහනේ අරමුණ බව බස්නාහිර පළාත් සභාව පවසයි.